
# Project 303
# 303 වන ව්‍යාපෘතිය




DP EDUCATION

## Coding School

## thunkable





LIVEWORKSHEETS

- Design කොටස පහත පරිදි සකසාගන්න.
    - ❖ මුලින්ම පහත දැක්වෙන ලින්ක් එක හරහා images download කරගන්න.ඉන්පසු ඒවා upload කරන්න.
      https://drive.google.com/drive/folders/1DdDZYSGDMoUivw4D_ojmZs2xoQ_oQPPT?usp=sharing
    - ❖ New Screen වෙත පිවිස new Screen add කර,එහි Screen name පහත පරිදි rename කරගන්න.
      **Screenstart, Screen1, Screen2, Screen3, Screen4, Screen5, ScreenAnswer, Screen lost, Screen win, Screen end**
    - ❖ දැන් අපි ඒ ඒ Screen වලට අදාල design කරගමු.
    - ❖ මුලින්ම **Screen Start** සඳහා design කරගමු.
    - ❖ Background colour ලෙස නිල්පාට(blue) ලබා දෙන්න.
    - ❖ පහත දැක්වෙන පරිදි vertical,horizontal Alignment සකසන්න.




    - ❖ Screen Start තුලට labelදෙකක්,image එකක්,buttonඑකක් එක් කරගන්න. එය පහත පරිදි දිස් විය යුතුය.




    - ❖ Button එක Start ලෙස rename කර text ->Start ලෙස ලබා දෙන්න.
    - ❖ Label 1 සඳහා " Remember the correct order of emogis and answer correctly " ලබාදෙන්න. Label 2 සඳහා "Memory Game”ලෙස text(font size=45) ලබා දෙන්න.

LIVEWORKSHEETS

- එහි start1 ලෙස ඇති පින්තූරය ඇඩ් කර height සහ width සඳහා absolute Size=150 ලබාදෙන්න.


- අපි දැන් **Screen1** design කරමු.ඔබ කැමති වර්ණයක් background color එක ලෙස ගන්න.
- ඉන්පසු image එකක් ඇඩ් කර img_1 ලෙස save කර ඇති image එක select කරගන්න.
- එවා පහත පරිදි දිස් විය යුතුය.ඔබට ලබා දී ඇත්තේ 1ක screen එකක් පමණි.ඒ ආකාරයෙන් Screen2, Screen3, Screen4, Screen5 වෙනකම් Screen ටික සදාගන්න.පිළිවෙලින් img_1 img_2, img_3, img_4, img_5 ලෙස image select කරගන්න.



- **Screenanswer** design කරමු. background color=”red”
- Button එකක් එක් කරගන්න. එහි text="Submit" ලබා දෙන්න.
- එකෙන් උඩට column එකක් ඇඩ් කර එය තුලට label එකක්ද ඇඩ් කරන්න. . එහි text="Put numbers into the correct order " ලබා දෙන්න.
- එයින් පහලට row 3ක් වෙන වෙනම ඇඩ් කරන්න.row1 සහ row2 තුලට columns 2 බැගින් add කරන්න.
- දැන් ඒ ඒ column තුලට text_input සහ imges යටතේ තියෙන image එකක්ද drag කරන්න.
- image එකේ height සඳහා 80 සහ width සඳහා 90 ලබාදෙන්න.

LIVEWORKSHEETS

- ❖ ඉන්පසු පහත පරිදි images, add කරන්න.
- ❖ අවසානයේ දී ඔබට මේ ආකාරයෙන් දිස්වේ.






- ❖ **දැන් අපි "screen win" design කරමු.**
- ❖ ඒ සඳහා මුලින්ම button දෙකක් add කර,text සඳහා yes , no ලබාදෙන්න.
- ❖ ඊලගට එම button දෙකට උඩින් label එකක් add කර "want to keep going" ලෙස type කරන්න.
- ❖ දැන් අපි image එකක් add කරමු.win ලෙස save කර ඇති image එක select කරන්න.
- ❖ **දැන් අපි "screen lost" design කරමු.**
- ❖ පෙර ලෙසම button දෙකක් add කර,text සඳහා yes , no ලබාදෙන්න.
- ❖ ඊලගට එම button දෙකට උඩින් label එකක් add කර "do you want to try again?" ලෙස type කරන්න.
- ❖ දැන් අපි image එකක් add කරමු.lost ලෙස save කර ඇති image එක select කරන්න.
- ❖ අවසාන screen එක ලෙස Screen end page එක design කරමු.
- ❖ ඒ සඳහා thank ලෙස save කර ඇති image එක select කරගන්න.

- **Design Part සියල්ල අවසන් නිසා Coding Part එකට වෙත පිවිසෙමු.**

  - ❖ මුලින්ම blocks tab එකට ගිහින් code එක නිර්මාණය කරගන්න පටන් ගමු.
  - ❖ Start button එක click කල විට screen1 load විය යුතුය. ඒ සඳහ පහත පරිදි code එක drag කර ගමු.


LIVEWORKSHEETS

❖ button start යටතේ තියෙන පහත code block එක drag කර, control වල තියෙන navigate කියන block එකත් drag කරන්න. Navigate to Screen1 ලෙස select කරන්න




❖ Screen1 open වෙලා තප්පර දෙකකින් screen2 open විය යුතුයි.

❖ එ සඳහා පහත code එක use කරන්න. Screen1 යටතේ තියෙන when screen1, code block එක drag කර, control වල තියෙන "wait" code block drag කර 2 second ලෙස වෙනස් කරන්න. navigate කියන block එකත් drag කරන්න. Navigate to Screen2 ලෙස select කරන්න.




❖ ඒ ආකාරයෙන් Screen5 වෙනකම් සදාගන්න. ඒ ඒ screen වලට අදාල ලෙස navigate to -> සඳහා screen3, screen4,screen5,screenanswer ලබා දෙන්න.

❖ **දැන් අපි screen answer code කරගමු.**

❖ එම screen එක තුල ඔබ ලබාදෙන පිළිතුරුවල නිරවද්‍ය බව පරික්ෂා කරයි.button submit යටතේ තියන when button submit ,code block එක drag කරන්න.එය තුලට control එක තුල තියෙන if else block එක drag කරන්න.

❖ දැන් අපි මේ සඳහ function එක නිර්මාණය කරමු.


❖ game එක win කරන්න නම්, text input සඳහා පිලිවෙළින් 2,3,4,5,1 ලබා දිය යුතුය.


❖ දැන් logic වල ඇති "and" code block එක drag කරන්න.එහි වම් පැත්තට logic වල ඇති සමාන ලකුණ සහිත block drag කරන්න.දකුණු පසට නැවත and block

LIVEWORKSHEETS

එකක් ඇඩ් කරන්න. මෙලෙස අවසානයේ දී and block 4ක් දකුණු පසට තිබිය යුතුය.


- = ලකුණෙන් වම්පසට text_input1 යටතේ තියෙන පහත දක්වා ඇති block එකට drag කරන්න. ඉන්පසු = ලකුණෙන් දකුණු පසට text වල "" ලකුණ drag කරන්න.එයට no 2 යොදන්න.




- ඉහත රූපයේ ආකාරයට පිළිවෙලින් text_input2, text_input3, text_input4, text_input5 සඳහා no=”3”,”4”,”5”,”1” යොදන්න.

- ඉන්පසු ඉහත පිළිතුරු නිවැරදිව ලබා දුන්නේ නම්,win page එකට යාමටත්,එලෙස නොමැතිනම් lost page එකට යාමටත් අදාල block යොදමු





- දැන් **Screen win** සහ **screen lost** pages සඳහා පහත code block එක යොදන්න.

- Button yes යටතේ ඇති “when button yes” block drag කර control යටතේ ඇති navigate to drag කර “screen start” select කරගන්න.

LIVEWORKSHEETS

- Button no යටතේ ඇති "when button no" code block drag කර control යටතේ ඇති navigate to drag කර "screen end" select කරගන්න.




LIVEWORKSHEETS